කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு

MINISTRY OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT









# ජාතික ශිල්ප සභාව

## කාර්ය සාධන විශ්ලේෂණ වාර්තාව

සැලසුම් අංශය - 2025

# ජාතික ශිල්ප සභාව

**හැඳින්වීම**

හස්ත කර්මාන්ත සංරක්ෂණය සහ සංවර්ධනය මෙන්ම හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු ශිල්පීන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වයන් නංවාලීම ප්‍රධාන අරමුණ කොට 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධිත ආයතන පනත යටතේ ජාතික ශිල්ප සභාව ස්ථාපිත විය. පසුගිය දශක කිහිපය තුළ ජාතික ශිල්ප සභාව විසින් හස්ත කර්මාන්ත සංරක්ෂණය, සංවර්ධනය සහ හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ සුභ සාධනය වෙනුවෙන් විවිධ ව්‍යාපෘතින් හා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

**දැක්ම**

"තිරසාර පැවැත්ම උදෙසා හෙළ අත්කම් පෝෂණය කිරීම හා සංරක්ෂණය කිරීම"

**මෙහෙවර**

"සාම්ප්‍රදායික සහ සංස්කෘතික වටිනාකමක් ඇති දේශිය හස්ත කර්මාන්ත සංරක්ෂණය කිරීම, සංවර්ධනය කිරීම, දිරි ගැන්වීම, ප්‍රවර්ධනය කිරීම සහ ශිල්පීන්ගේ ආර්ථික හා සමාජයීය තත්ත්වය නංවාලීම"

**පරමාර්ථ**

- **වසර 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයෙන් කරනු ලබන දායකත්වය 50% කින් ඉහළ නැංවීම.**
- **වසර 2030 වන විට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත ස්වයං රැකියා 4000 ක් ජනිත කිරීම.**
- **වසර 2030 වන විට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත තරුණ හා කාන්තා ව්‍යවසායකයින් 400 ක් නිර්මාණය කිරීම.**
- **වසර 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙහි හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත අපනයන කොටස**

| **1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පනත අනුව (17 වැනි පරිච්ඡේදය) ජාතික ශිල්ප සභාව වෙත පවරා ඇති බලතල සහ කාර්යයන්** |
|---|
| 1. ශ්‍රී ලංකාවේ සහ විදේශවල ප්‍රදර්ශන පැවැත්වීම. |
| 2. හස්ත කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රයෝජනයට ගන්නා වූ අමුද්‍රව්‍යවල සහ නිමි භාණ්ඩවල තත්ත්වය වැඩි දියුණු කිරීම. |
| 3. හස්ත කර්මාන්තය අධ්‍යයනය කිරීම සඳහා ත්‍යාග, පදක්කම් සහ ශිෂ්‍යත්ව ඇති කර ප්‍රදානය කිරීම. |
| 4. හස්ත කර්මාන්ත භාණ්ඩ මෝස්තර කිරීමේ, නිෂ්පාදනය කිරීමේ හෝ විකිණීමේ යෙදී සිටින්නා වූ ශිල්ප සභා හෝ වෙනත් ආයතන හෝ සංවිධානවලට අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මූල්‍ය සහ වෙනත් යම් ආධාර සැපයීම. |
| 5. ශිල්පීන් පුහුණු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ශිල්පීන් සහ ආධුනිකයන් සඳහා සියලු වැඩසටහන් පිළිබඳව සහ ශිල්පීන් සමඟ සම්බන්ධතා ඇති පුහුණුවීමේ ආයතන භාර සේවා නියුක්තයන්ට උපදෙස් දීම. |
| 6. ශිල්පීන්ගේ සුභසාධනය සඳහා යෝජනා ක්‍රම ආරම්භ කිරීම. |
| 7. ශිල්පීන් සඳහා ජාත්‍යන්තර හුවමාරුකර ගැනීමේ වැඩසටහන් ආරම්භ කිරීම. |
| 8. ශිල්පීන්ගේ තත්ත්වයන් සහ දක්ෂතා දියුණු කිරීම පිණිස පාරම්පරික, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සම්මේලන සංවිධානය කිරීම. |
| 9. ශිල්ප වලට අදාල තොරතුරු සහ දැනුම පැතිරවීම සඳහා විධිවිධාන සැලැස්වීම. |
| 10. පාරම්පරික, ජාතික හෝ සංස්කෘතික වටිනාකමකින් යුත් හස්ත කර්මාන්ත ආරක්ෂා කිරීම පිළිබඳ උපදෙස් දීම සහ ඒ හස්ත කර්මාන්ත ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා ශිල්ප කෞතුකාගාර සහ චිත්‍රාගාර පිහිටුවීම. |

| හඳුනාගත් ගැටළු | |
|---|---|
| A. | ශිල්පීන් විසින් මුහුණදෙනු ලබන සමාජීය හා ආර්ථික ගැටළු |
| B. | ගුණාත්මක නිෂ්පාදන නිර්මාණය කිරීම සඳහා ප්‍රමාණවත් දැනුමක් ඇතැම් ශිල්පීන්ට නොමැති වීම. |
| C. | නවීන ක්‍රමවේද සහ නවීන තාක්ෂණයන් භාවිතා කිරීමට ශිල්පීන් දක්වන අකමැත්ත. |
| D. | නව තාක්ෂණයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ධාරිතාවක් ශිල්පීන්ට නොමැති වීම. |
| E. | ශිල්පීන්ගේ හුදකලාභාවය හේතුවෙන් තවදුරටත් සංවර්ධනය වීමට අවස්ථා අවම වීම. |
| F. | ශිල්පීන් නව නිර්මාණ බිහි කිරීම සඳහා පෙළඹවීමක් නොමැති වීම සහ සාම්ප්‍රදායික ක්‍රමවේදයන් තුළ රැඳී සිටීම. |
| G. | පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා නවීන ගොඩනැගිලි සහ පහසුකම් නොමැති වීම. |
| H. | නව පරම්පරාව හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලීමට ඇති අකමැත්ත |
| I. | පාසල් දරුවන් සහ නව පරම්පරාව අතර අත්කම් නිර්මාණ පිළිබඳ නිසි දැනුමක් නොමැති වීම. |
| J. | ප්‍රමාණවත් අමුද්‍රව්‍ය නොමැති වීම සහ අමුද්‍රව්‍ය ප්‍රවාහනය සම්බන්ධයෙන් පවතින දුෂ්කරතා |
| K. | බොහෝ ශිල්පීන් තම ශිල්ප ක්ෂේත්‍රයේ සාම්ප්‍රදායික අංග වෙනස් කිරීමට ඇති අකමැත්ත සහ එමඟින් නිර්මාණාත්මක නවෝත්පාදනයන් බිහි වීම අවම වීම. |
| L. | ශ්‍රී ලාංකික අත්කම් සඳහා දේශීය හා ගෝලීය වශයෙන් වෙළඳපොළ අවස්ථා නොමැතිකම. |
| M. | ප්‍රමුඛ සන්නාමයක් නොමැති වීම සහ ප්‍රවර්ධනාත්මක ක්‍රියාකාරකම් අවම මට්ටමක පැවතීම. |
| N. | නිෂ්පාදන පිරිවැය ඉහළ මට්ටමක පැවතීම. |

| ගැටළු ජය ගැනීම සඳහා ක්‍රියාත්මක කළ යුතු උපාය මාර්ග | |
|---|---|
| A. | අමුද්‍රව්‍ය පහසුකම් සංවර්ධනය කිරීම. |
| B. | නිෂ්පාදන සංවර්ධනය/විවිධාංගීකරණය සහ තත්ත්ව පාලනය |
| C. | යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. |
| D. | නව යන්ත්‍රෝපකරණ, උපකරණ සහ අමුද්‍රව්‍ය සැකසීම සඳහා තාක්ෂණික සංවර්ධනය. |
| E. | කුසලතා, ධාරිතාවය, තාක්ෂණික දැනුම, ව්‍යවසායකත්වය වර්ධනය කිරීම. |
| F. | වෙළඳපොළට ප්‍රවේශය සඳහා වෙළඳපොළ ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම. |
| G. | ශිල්පීය හැකියාවන් ඇගයීම සහ ආරක්ෂා කිරීම. |
| H. | මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා පහසුකම් සැපයීම. |
| I. | හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ ස්වයං රැකියා සඳහා පහසුකම් සැලසීම. |


| ශක්තීන් | අවස්ථා |
|---|---|
| 1. හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සංරක්ෂණය, සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා ස්ථාපිත ඉහළම රජයේ ආයතනය වීම. | 1. සමස්ථ ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි සාම්ප්‍රදායික හා නවීන කුසලතාවන්ගෙන් පරිපූර්ණ වූ දක්ෂ ශිල්පීන් සිටීම. |
| 2. පාර්ලිමේන්තු පනතක් යටතේ ස්ථාපිත ස්වාධීන ආයතනයක් වීම. | 2. උසස් තත්ත්වයේ අත්කම් භාණ්ඩ සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළක් පැවතීම. |
| 3. වෙළඳ ප්‍රදර්ශනාගාර, ශිල්ප පුහුණු මධ්‍යස්ථාන සහ වෘත්තීය සහ පළපුරුදු උපදේශකයින් ජාලයක් තිබීම. | 3. හස්ත කර්මාන්ත අංශය වැඩිදියුණු කිරීම සඳහා අදාළ අමාත්‍යාංශයේ සහ රජයේ ප්‍රතිපත්තිවල විශේෂ අවධානයක් යොමු කර ඇත. ශ්‍රී ලංකාවේ අත්කම් කර්මාන්තය පෝෂණය කිරීම සඳහා රජයේ කැපවීම සහ ප්‍රතිපත්ති පැවතීම. |
| 4. ප්‍රධාන කාර්යාලයේ මෙන්ම පළාත් සහ දිස්ත්‍රික් කාර්යාලවල ශක්තිමත් කැපවූ කාර්ය මණ්ඩලයක් සිටීම. | 4. දේශීය නිෂ්පාදනය සහ පරිසර හිතකාමී නිෂ්පාදන කෙරෙහි ඇති ප්‍රවණතාවය. |
| 5. අමාත්‍යාංශයේ පූර්ණ අනුග්‍රහය සහ සහයෝගය අඛණ්ඩ ලැබීම. | 5. හස්ත කර්මාන්ත අංශයේ සංවර්ධනය සඳහා අරමුදල් (පරිත්‍යාග, ප්‍රදාන, සහනදායී ණය ආදිය) ලබා ගැනීමට හැකිවීම. |
| 6. හස්ත කර්මාන්ත නිෂ්පාදන, අපනයන සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වගකිව යුතු ආයතන අතර නිසි අන්තර් සම්බන්ධතාවයක් තිබීම. | 6. හස්ත කර්මාන්තය සමඟ පෞද්ගලික අංශයේ සහභාගීත්වය සහ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ සැලකිය යුතු වර්ධනය. |
| 7. ජාතික ශිල්ප සභාව සහ රට පුරා විසිරී සිටින ශිල්පීන් අතර ශක්තිමත් සම්බන්ධතාවයක් තිබීම. | 7. සාර්ක් සහ ලෝක ශිල්ප සභාව වැනි ජාත්‍යන්තර සංවිධානවල මූල්‍ය හා තාක්ෂණික සහාය. |

<table>
<tr><th>දුර්වලතා</th><th>අභියෝග</th></tr>
<tr><td>1. අදාළ සංවිධානවල කාර්යයන් සහ සේවාවන් වෙන්කර හඳුනා නොගෙන සියලුම සංවිධාන එකම කාර්යයන් ඉටු කරයි.</td><td rowspan="2">1. නූතන පරම්පරාව හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට පිවිසීමට ඇති අකමැත්ත</td></tr>
<tr><td>2. ඉහළ සිට පහළට ප්‍රමාණවත් අධීක්ෂණයන් හා ඇගයීමක් නොමැති වීම.</td></tr>
<tr><td>3. ජාතික ශිල්ප සභාව සහ අනුබද්ධ ආයතන වන ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය සහ ජාතික මෝස්තර මධ්‍යස්ථානය සමඟ ප්‍රමාණවත් අන්තර් සම්බන්ධතාවයක් නොමැති වීම.</td><td rowspan="2">2. ජාතික ශිල්ප සභාවේ කාර්යභාරය සහ සේවාවන් පිළිබඳව රජය සහ අනෙකුත් අංශ ප්‍රමාණවත් ලෙස දැනුවත් වී නොමැති වීම.</td></tr>
<tr><td>4. විශේෂිත වෘත්තීය අත්දැකීම් සහ දැනුම සහිත කාර්ය මණ්ඩලයේ ප්‍රමාණවත් නොවීම.</td></tr>
<tr><td>5. ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම.</td><td rowspan="2">3. විදේශ රටවල හස්ත කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන සඳහා පවතින මිල සාපේක්ෂව අඩු වීම.</td></tr>
<tr><td>6. කාර්ය මණ්ඩලයේ තුල වෙනස් වීමට ඇති අකමැත්ත සහ ඍණාත්මක ආකල්ප.</td></tr>
<tr><td>7. තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් සහ තාක්ෂණික කණ්ඩායම් කාර්ය මණ්ඩලය තුල නොමැති වීම.</td><td rowspan="2">4. සාර්ක් රටවලින් හස්ත කර්මාන්ත නිෂ්පාදන පහසුවෙන් ආනයනය කිරීම.</td></tr>
<tr><td>8. ප්‍රතිඵල කේන්ද්‍ර කරගත් මානසිකත්වයකට වඩා ප්‍රතිදානය පාදක කරගත් මානසිකත්වයක් කාර්ය මණ්ඩලය තුළ තිබීම.</td></tr>
<tr><td>9. හස්ත කර්මාන්ත ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය සඳහා තාක්ෂණික මෙවලම් සහ උපකරණ භාවිතය නොමැතිකම.</td><td rowspan="2">5. අමුද්‍රව්‍ය හිඟය සහ අධික පිරිවැය.</td></tr>
<tr><td>10. නිර්මාණ සඳහා ඉහළ මිලක් නියම කිරීම සහ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතාව අඩු වීම.</td></tr>
</table>


**ජාතික ශිල්ප සභාවේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම්**

- පුහුණුව සහ ස්වයං රැකියා
  - හස්ත කර්මාන්ත ආශ්‍රිත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
  - ශිල්පීය හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
  - ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා පහසුකම් සැලසීම.
- අමුද්‍රව්‍ය සහ තාක්ෂණය
  - අමුද්‍රව්‍ය ආශ්‍රිත ගැටළු අවම කිරීම සඳහා සම්බන්ධීකරණය සහ සහාය වීම.
  - හස්ත කර්මාන්ත ආශ්‍රිත අමුද්‍රව්‍ය ක්‍රියාවලිකරණය සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම.
- අලෙවිකරණය සහ මූල්‍ය
  - දේශීය හා විදේශිය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
  - ශිල්පීන් සඳහා මූල්‍ය පහසුකම් ලබාදීම සඳහා සම්බන්ධීකරණය කිරීම.
- නිෂ්පාදන සංවර්ධනය සහ ව්‍යවසායකත්වය
  - හස්ත කර්මාන්ත නිෂ්පාදන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
  - හස්ත කර්මාන්ත ශිල්පීන් අපනයන මට්ටමේ ව්‍යවසායකයින් බවට පත් කිරීම
- ඇගයීම සහ සුභසාධනය
  - ශිල්ප අභිමානි තරඟය, ප්‍රදර්ශනය සහ සම්මාන උළෙල පැවැත්වීම.
  - ශිල්පීන් සඳහා සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
  - ශිල්පීන් ලියාපදිංචි කිරීම
  - සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත සංරක්ෂණය


## ශිල්ප පුහුණු මධ්‍යස්ථානය මඟින් පුහුණු පහසුකම් සැපයීම.





## හස්ත කර්මාන්ත ශිල්පීන් ලියාපදිංචි කිරීම




## ශිල්ප සුභසාධන වැඩසටහන





## දේශීය හා විදේශීය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්



## ශිල්ප සමාජ පිහිටුවීම




## වාර්ෂික සංවර්ධන වැඩසටහන් වලට අදාල ප්‍රාග්ධන ප්‍රතිපාදන සහ සත්‍ය වියදම්



# විශේෂ සංවර්ධන වැඩසටහන්

**01.සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන – 2021**

සංවර්ධනය කරන ලද ගම්මාන සංඛ්‍යාව – 98, ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 2762

**02. "ශිල්ප අභිමාණී" පළාත් සහ ජාතික මට්ටමේ තරඟ , ප්‍රදර්ශනය සහ සම්මාන උළෙල .**

| අ.අ. | වර්ෂය | සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව | සම්මානලාභී ශිල්පීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | 2021 | 3676 | 456 |
| 02 | 2023 | 3941 | 508 |
| 03 | 2024 | 3075 | 407 |

**03. ලක්ශිල්ප අලෙවිසැල් සංවර්ධනය කිරීම.**

වරාගොඩ , ගාල්ල - සිප්නාරා , මොලගොඩ, පල්ලෙකැලේ

**04. "ක්‍රාෆ්ටින් සිලෝන්" අපනයන අභිමුඛ නිෂ්පාදන සංවර්ධන වැඩසටහන – 2022/2023**

සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව – 1553, ජයග්‍රාහී නිර්මාණ සංඛ්‍යාව - 546

**05. ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය**

| වර්ෂය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| සංවර්ධනය කරන ලද මධ්‍යස්ථාන සංඛ්‍යාව | 08 | 03 | - | - | 03 |

## සුවිශේෂ ජයග්‍රහණ

## Asia Pacific Region Crafts Master Award – 2023







## World Crafts Council Asia Pacific Region Award of Excellence – 2024







